**ශිර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනයකළ මතය

ශිර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 2.3 (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික විම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br><br>දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2.2 (අ) |
| 2.4 අ (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 135 හා 381 (**i**) ප්‍රකාරව පුහුණු මධ්‍යස්ථානවල සියළුම කාර්යයන් මූල්‍ය පාලන බලතල පවරා දීමකින් තොරව අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි. | 2.3(අ) (i) |
| 2.5 අ | 2013 අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි සහනාධාර ගෙවීම සඳහා එවකට සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි අධිකාරියෙන් ලබාගත් රු.මිලියන 2,374 ක මුදල වසර 8 කටත් අධික කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2.6 (අ) |
| 2.6 | සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා විවිධ අරමුණු සඳහා පිහිටුවා ඇති දෙපාර්තමේන්තුවේ පවතින අරමුදල් ගිණුම්වලින් එකී අරමුණු වලින් බැහැරව රු. මිලියන 53,594.67 ක් රජයේ විවිධ අවශ්‍යතා සඳහා ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට මෙම මුදලින් රු. මිලියන 53,294.97 (පොලී සහිතව) තවදුරටත් අයවීමට තිබුණි. | 2.4(ඇ) (i) |
| 2.7 (ආ) | සේවක ණය චක්‍රිය ගිණුමට අදාල 2022 දෙසැම්බර් බැංකු සැසඳුම් පරික්ෂාවේදී වර්ෂ 4 සිට වර්ෂ 8 දක්වා කාල පරාසයක් තුළ තැන්පත්කල නමුත් උපලබ්ධි නොවූ රු. 2,668,654 ක් වටිනා චෙක්පත් 84 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2.3 (අ) (ii) (ii) |

3.5 සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල 2014-2018 කාලය තුල සිදුවූ වටිනාකම රු. 115,723,619 ක් වූ වංචා 135 ක් පිළිබඳ 2018 සහ 2019 විගණකාධිපති වාර්තාවලින් පෙන්වාදී තිබුණි. 2023 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව 2014-2018 කාල පරිච්ඡේදය සඳහා වංචා 15ක් වෙනුවෙන් රු. 63,817,207 ක් ද 2019 සිට 2023 පෙබරවාරි දක්වා වංචා 92 ක් වෙනුවෙන් රු. 172,189,227ක් ද හඳුනාගෙන තිබුණි. සියළු සමෘද්ධි බැංකු හා බැංකු සමිති පරිගණක ක්‍රියාවලියට යටත් කිරිම සිදු කරමින් ගනුදෙනු කරුවන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරිමත් එමෙන්ම අතින් (Manual) සිදු කිරිමේදී සිතාමතා සිදු කරන වැරදි හා මූල්‍ය වංචා අවම කරගැනීමට අපේක්ෂා කලද වාර්තාවී ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි. 3.2(අ)

3.6.1 (ඇ) සමෘද්ධි ප්‍රජා මූල බැංකු ගණුදෙණු කාර්යක්ෂමව කිරීම සඳහා Soft Watch හා SLTS වශයෙන් මෘදුකාංග දෙකක් හඳුන්වා දී තිබුණි. සමෘද්ධි බැංකු ශාඛා 1026 ක් මෙම මෘදුකාංගය භාවිතා කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලය සමඟ ඒකාබද්ධ නොවූ ශාඛා 12 ක් විසින් වසර 10 ටත් වඩා පැරණි මෘදුකාංගයකින් කටයුතු සිදු කරනු ලබයි. පද්ධතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ප්‍රජා මූල බැංකු 9 ක සිදුකල නියැදි පරීක්ෂාවේදී පහත අඩුපාඩු පවතින බව නිරීක්ෂණය විය. 3.4(ආ)

දිනකට සිමිත මුදල් ගෙවීම් ප්‍රමාණයක් පමණක් ක්‍රියාත්මක කළ හැකි වීම තුළින් පද්ධතිය මන්දගාමී වීම, ණය අයවීමේදී ක්‍රමවත් බවක් නොවීම ,ගිණුම් ශේෂ නිවැරදි නොවීම, පෙර ගනුදෙනු පරීක්ෂා කළ නොහැකි වීම, පරිගණක පද්ධතිය විටෙන් විට බිඳ වැටිම, බැංකුවේ සජිවි දත්තවලට ඇතුල් වීමේ හැකියාව මෘදුකාංග ආයතනයට තීබිම හේතුවෙන් දත්ත වෙනස්කල අවස්ථා පැවතීම හා පරිගණක පද්ධතිය මඟින් සහනාධාරලාභීන්ගේ ගිණුම්වලට බැරවන මුදල් වලින් ස්වයංක්‍රීයව ණය අය කර ගැනීමට ඉඩ පහසුකම් සලසා තිබීම හේතුවෙන් ප්‍රජාමූල බැංකු 05 කට අයත් සහනාධාරලාභින් 173 දෙනෙකුගේ ගිණුම්වලට බැර වූ සහනාධාර
මුදල් රු.3,857,777 ක් ණය වාරික ලෙස අය වී තිබූ අවස්ථා නියැදි විගණනයේදී නිරීක්ෂණය විය.

3.6.2 (අ) 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 36 වගන්තිය යටතේ දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, ත්‍යාග පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් ත්‍යාග වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වේ. ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම සංවර්ධන අරමුදලට බැරකල යුතු වුවත් දිවිනැගුම සංවර්ධන අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි. 3.4 (අ)

| | | |
|---|---|---|
| 3.6.2 (ආ) | උක්ත පනතේ 45 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් අරමුදල් 6 ක් පවත්වාගෙන යනු ලබන අතර සමෘද්ධි අරමුදල හා සේවක ණය චක්‍රීය අරමුදල මේ වන විට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | 2.4(ආ)(iii) |
| 4 (ඇ) | 2019 ජුලි 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 25 (3) වගන්තිය අනුව ප්‍රජාමූල බැංකු කාර්යමණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවකයින් ස්ථිර පදනමින් පත්කිරීම නීතියට පටහැනි බව ගරු නීතිපති තුමා විසින් දැනුම් දී ඇති බවත්, ප්‍රජා මූල බැංකු සමිතිවල දැනටමත් සේවයේ යෙදී සිටින දිවි නැගුම පනතේ 44 (i) හා ii යටතේ දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූ නිලධාරීන් තාවකාලික පදනමින් එම ආයතනවලට මුදා “හැර ඇති බවට සැලකිය යුතු වන අතර, ඉදිරියේදී බැංකු කාර්ය මණ්ඩලය සඳහා වෙනම තනතුරු අනුමත කරවා ගැනීමටත් ඉන් අනතුරුව පුරප්පාඩු වන තනතුරු සඳහා ඒ අනුව බඳවා ගැනීම් කිරීමට කටයුතු කළ යුතු බව දැක්වුවද, මේ දක්වා ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර බැංකු කාර්ය මණ්ඩලය 7605 ක් සඳහා දෙපාර්තමේන්තු වැය විෂයයෙන් වැටුප් ගෙවා තිබුණි. 2022 වර්ෂය සඳහා ගෙවා ඇති මුදල රු මිලියන 4,259.25 ක් විය. | 5(ඇ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සටහන 7 යටතේ සහනාධාර ප්‍රදාන සහ මාරුකිරීම් තත්‍ය වියදම වශයෙන් වැඩසටහන් 02 හි වැය විෂය 1501, 1502 හා 1506 හි වියදම් එකතුව හා වැඩසටහන් 01 හි 1506 වැය විෂයෙහි වියදම් රු. 100,186,608,556 ක් දක්වා තිබුණද සටහන 07 හි එම වියදම් වල සංශෝධිත අයවැය තීරුවෙහි රු. 110,708,344,506 ක් ලෙස දක්වා තිබුණි ඒ අනුව 1506 වැය විෂය යටතේ වූ ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,800,000 ක් දක්වා නොතිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි සංශෝධිත අයවැය ඇස්තමේන්තුවෙහි සටහන 7 සංශෝධනය කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුයි. |

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------ | ------------------------ | -------------- |
| 2023 නොවැම්බර් 01 දිනැති අංක 04/2023දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.9 ඡේදය හා 2023 ඔක්තෝබර් 03 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2023/02 අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීමේදි මූල්‍ය නොවන වත්කම්හි ගිණුම්මය නිවැරදිතාවය පිළිබඳ අවධානය යොමු නොකිරීමෙන් පෙර වර්ෂයේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ අතර රු. 964,500 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ ආරම්භක ශේෂ නිවැරදි වන අතර නිවැරදි නොවන්නේ 2022 වර්ෂයේ අවසාන ශේෂය බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුයි. |

(ඇ) අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම් වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------- | -------------------------------- | --------------- |
| **(i)** 2023 නොවැම්බර් 07 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03/2023 හි අංක 5 ඡේදය අනුව මාර්ගෝපදේශ අංක 02 හි සඳහන් උපදෙස්වලට අනුකූලව අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් වූ පාලන ගිණුම භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ නොපමාව සැසඳිය යුතු වුවත් අත්තිකාරම් බී ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාර පොත් සමඟ රු. 20,487,625 ක වෙනසක් පැවති අතර එයින් රු. 716,896 ක් හඳුනාගෙන නොතිබුණි. | නිරවුල් කළ යුතුව ඇති හඳුනා නොගත් රු 716,896 ක ශේෂය හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින අතර එම ශේෂය ද හඳුනාගත් වහාම ගිණුම්ගත කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2023 දෙසැම්බර් 31 දිනට සේවකයින් 67 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 1,654,710 ක් වසර 01 සිට වසර 05 කට අධික කාලයක් හිඟ හිට පැවතුණි. මෙම ණය ශේෂය තුල වසර 3 ත් 5 ත් අතර හිඟ හිටි ශේෂය රු. 563,344 ක් ද වසර 1 ත් 3 ත් අතර හිඟ හිටි ශේෂය රු. 85,595 ක් වශයෙන් පැවතුණි. | තවදුරටත් නිරවුල් කළ යුතු ශේෂ හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | මාර්ගෝපදේශය ප්‍රකාරව ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුයි**.** |

**(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | | **රු.** | | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 135 හා 381 **(i)** | - | පුහුණු මධ්‍යස්ථානවල සියළුම කාර්යයන් මූල්‍ය පාලන බලතල පවරා දීමකින් තොරව අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි. | ගිණුම් විවෘත කිරීමට අවශ්‍ය සියළු ලේඛන මේ වනවිට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| **(ii)** | මුදල් රෙගුලාසි 396 | 7,090,372 | I. දිස්ත්‍රික් කාර්යාලවල බැංකු සැසඳුම් පරීක්ෂාවේදී 2023 දෙසැම්බර් 31 දින වන විට | දිස්ත්‍රික් කාර්යාලයන් හි බැංකු සැසඳුම් වල සඳහන් වී ඇති කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලෙස | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | නිකුත් කර මාස 6 ඉක්ම වූ එකතුව රු 7,090,372 ක් වූ චෙක්පත් 139 සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබුණි. මෙම වටිනාකම තුල මහනුවර දිස්ත්‍රික් කාර්යාලයට අයත් 2015 පෙබරවාරි -2016 ජූලි දක්වා වටිනාකම රු3,888,099 ක් වූ චෙක්පත් 26 ක් නිකුත් කර ඇත්තේ කාහටද යන්න තහවුරු කරගෙන නොතිබුණි. | ගණකාධිකාරීවරුන් දැනුවත් කර ඇති බව හා මහනුවර ශේෂය නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | |
| 1,739,536 | II. සේවක ණය චක්‍රීය ගිණුමට අදාල 2023 දෙසැම්බර් බැංකු සැසඳුම් පරීක්ෂාවේදී වර්ෂ 5 සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක් තුළ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ එකතුව රු. 1,559,536 ක් වටිනා චෙක්පත් 67 ක් හා වසර 6 ක් ඉක්ම වූ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු. 180,000 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි | බැංකු සැසඳුම් නැවත පිළියෙල කර දෝෂය හඳුනා ගැනීමට හා නිෂ්කාෂණය නොවූ චෙක්පත සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා තහවුරු කර ගැනීමෙන් අනතුරුව 2024 මැයි මස ගිණුම් සටහන් තබා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| (iii) | 2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2020 02 (අ) | 26,172,500 | අපහරණයට සුදුසු තත්ත්වයේ පවතින වටිනාකම රු.5,180,000 ක් වූ වාහන 3 ක් හා දීර්ඝ කාලයක් තිස්සේ කාර්මික දෝෂවලට ලක්ව අළුත්වැඩියා කිරිම ඵලදායී නොවන තත්ත්වයේ පැවති වටිනාකම රු. 20,992,500 ක් වූ වාහන 7 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. | වාහන අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින අතර, ඒ අනුව අපහරණය කළයුතු වාහන සම්බන්ධව වාහන වල තක්සේරු වාර්තා ලබා ගැනීමට තක්සේරු කමිටුවක් පත් කර ඇති අතර, ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

**(ඉ) අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) දෙපාර්තමේන්තුව සතු අනුමත නොවූ අරමුදල්.**

දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනු කර තිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ බැංකු මූල්‍ය අංශය සතුව රක්ෂණ අරමුදල් ද ඇතුළුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 15 ක් පවතින අතර ඉන් දැනට අරමුදල් 9 ක් ක්‍රියාත්මක නොවන අතර ක්‍රියාත්මකව පවතින්නේ අරමුදල් 6 ක් පමණි. මෙම සියළු අරමුදල් වල පවතින මුදල් බැංකු මූල්‍ය අංශය විසින් ආයෝජනයන් සිදුකර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට පොලී මුදලද ඇතුළුව සමස්ථ ආයෝජන අරමුදල රු බිලියන 49.5 ක් වී තිබුණි. | දැනට ක්‍රියාත්මක නොවන අරමුදල් වල ඇති ශේෂයන් සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග හා අදාල අරමුදල් අවසන් කිරීම සම්බන්ධව භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීම හා දැනට ක්‍රියාත්මක වන අරමුදල් විගණනය කළ හැකි පරිදි භාන්ඩාගාරයේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | සියළු අරමුදල් නීත්‍යානුකූල කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිවිනැගුම පනතේ 44 (ආ) වගන්තිය ප්‍රකාරව ඉවත් කරන ලද පනත් යටතේ පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන අධිකාරිය,දක්ෂිණ සංවර්ධන අධිකාරිය උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි වලට අයත්වන්නාවූ සියළු නිශ්චල හා චංචල දේපල රජයට පවරාදිය යුතු බව සඳහන් කර ඇත. ඉහත ආයතන වල ස්ථාවර වත්කම් සමෘද්ධි දෙපාර්තමේන්තුවට පවරාගෙන තිබූ අතර ඉහත සඳහන් අරමුදල් වල ශේෂයන්ද දෙපාර්තමේන්තුවට පවරාගෙන ස්ථාවර තැන්පත් වශයෙන් මේ දක්වා බැංකු මූල්‍ය අංශය යටතේ රඳවාගෙන තිබුණි. මෙම අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලද ඇතුලත් කිරීමට නොහැකි අතර මෙම කිසිඳු අරමුදලක් සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දිවිනැගුම පනතේ 44 (ආ) වගන්තිය ප්‍රකාරව ඉවත් කරන ලද පනත් යටතේ පිහිටුවන ලද අධිකාරි වලට අයත්වන්නාවූ සියළු නිශ්චල හා චංචල දේපල සහ අරමුදල් වල ශේෂයන්ද දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇත.ස්ථාවර තැන්පත් වශයෙන් මේ දක්වා දෙපාර්තමේන්තුවේ බැංකු මූල්‍ය අංශය යටතේ තැන්පත් වශයෙන් රඳවාගෙන ඇති අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලද ඇතුලත් කිරීමට නොහැකි වූ බව පිළිගන්නා බව හා මෙම අරමුදල් සියල්ලෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | සියළු අරමුදල් නීත්‍යානුකූල කොට ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුයි. |
| (ඇ) | ක්‍රියාත්මක නොවන අරමුදල් පනතේ උක්ත වගන්තිය ප්‍රකාරව හා 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/1 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 15 (2) (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු අවසන් කෙරෙන අරමුදල් වලින් ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරිමෙන් පසුව ඉතිරි වන මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට හා භාහිර ආයතන වල සිදුකරන ලද ආයෝජන කල් පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට හෝ ක්‍රියාත්මක වන අරමුදල් ව්‍යවස්ථාපිතකොට විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 10 ක් ගතවී තිබුණද නොහැකිවී තිබුණි. ඒ අනුව මෙමඟින් රාජ්‍ය මුදල් අවභාවිතාවී ද යන්න පරීක්ෂා කල නොහැකි අතර මෙම මුදල් රාජ්‍ය මූල්‍ය පාලනයෙන් ද බැහැරවී ඇත. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් සමෘද්ධි පනතේ පවතින විධිවිධාන තුළ කටයුතු කළ හැකි ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමටත්, ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර එකගතා ඇති කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව. | ක්‍රියාත්මක නොවන අරමුදල් සම්බන්ධව චක්‍රලේඛය ප්‍රකාරව තටයුතු කල යුතු අතර ක්‍රියාත්මක වන අරමුදල් රාජ්‍ය මූල්‍ය පාලනයට යටත් කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 II කොටස 3.1 ඡේදය පරිදි රාජ්‍ය ආයතනවලට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී සිටින රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින් හෝ ඔවුන්ගේ නියෝජිතයින්/ තැරැව්කරුවන් වෙතින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ තරඟකාරී මිල ගණන් කැඳවීම මඟින් සාමාන්‍ය රක්ෂණාවරණ ලබාගත යුතු වුවත් කළමනාකරණ මණ්ඩලය විසින් විවිධ අවස්ථාවල රක්ෂණ ක්‍රම අනුමත කර තිබුණු අතර රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ වලට අනුගත නොවී විනිවිදභාවයකින් තොරව හා රක්ෂණ මූලධර්ම වලට අනුකූල නොවන ලෙස එම රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කර වන්දි ගෙවීම්ද සිදුකර තිබුණි. ඒ සඳහා අරමුදල් ගිණුම් ද පවත්වාගෙන ගොස් තිබුණ ද එම ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. රක්ෂණ අරමුදලින් රු. මිලියන 548.6 ක් වූ ස්ථාවර තැන්පත් දෙපාර්තමේන්තුවේ බැංකු මූල්‍ය අංශය විසින් රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පත් ලෙස ආයෝජනය කර තිබුණි. | සමෘද්ධි බැංකුවල පවතින මහජනතාවගේ මුදල් වල හා එම බැංකු වල රාජකාරිවල නියුක්ත වන නිලධාරීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියෙන් රක්ෂණ වැඩසටහන ආරම්භ කර ඇත. නිරීක්ෂණයෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැංකු කළමනාකරණ මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර රක්ෂණ මූලධර්ම අනුව මින් ඉදිරියට කටයුතු කරන අතර රක්ෂණ අරමුදලේ ගිණුම් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කරන බව. | රක්ෂණ කටයුතු චක්‍රලේඛය ප්‍රකාරව සිදු කළ යුතුයි. |
| (ඉ) | ප්‍රජාමූල බැංකුවකින් රු. 40,000 ක් හා ප්‍රජාමූල බැංකු සමිතියකින් රු.25,000 බැගින් රැස්කොට කොවිඩ් රෝගයෙන් මියගිය එක් නිලධාරියෙකු වෙනුවෙන් මිලියන 01 ක වන්දියක් ලබාදීමට 2021 ජූනි 01 දිනැති අංක 21/88/03 දරන කළමනාකරණ මණ්ඩල තීරණය මඟින් ශාරීරික අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා අනුමතිය ලබාදී තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුල මියගිය නිලධාරීන් වෙනුවෙන් රු. මිලියන 21.79 ක වන්දි මුදලක් මෙම අරමුදලින් අවිධිමත් ලෙස ගෙවා තිබුණි. | කොවිඩ් හා හදිසි අනතුරු රක්ෂණය සඳහා බැංකු සමිතියකින් රු.25,000 හා බැංකුවකින් රු.40,000 බැගින් අයකර නිලධාරීන් කොවිඩ් රෝගයෙන් මියයාමේදී රු.මිලියන 1 ක වන්දි මුදලක් ගෙවන ලද අතර 2025 වර්ෂයේ සිට මෙම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක නොවන බව. | පවත්නා නීතිරීති අනුව රජයේ නිළධාරීන් වෙනුවෙන් මෙවැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කල නොහැකි බැවින් මෙම රක්ෂණ ක්‍රමය අහෝසි කළ යුතු අතර වැරදි ගෙවීම් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | බැංකු මූල්‍ය අංශයේ 2023 වර්ෂයේ වියදම් ඇස්තමේන්තුව රු. මිලියන 2496 ක් වූ අතර සමස්ථ වියදම රු. මිලියන 3443 ක් වී තිබුණි. බැංකු මූල්‍ය අංශය විසින් වාර්ෂිකව වෙනම | බැංකු කළමනාකරණ මණ්ඩලයේ බලයදීම මත ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයේ කාර්යභාරය ස්වාධීන ලෙස සළකා කටයුතු කරයි. ඊට | බැංකු මූල්‍ය අංශයට ස්වාධීන ඒකකයක් ලෙස කටයුතු කල නොහැකි බැවින් වෙනම මූල්‍ය ප්‍රකාශන අයවැය ඇස්තමේන්තු සකස් කල |

| | | | |
|---|---|---|---|
| | වියදම් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශනද සකස් කරනු ලබයි. මෙසේ දෙපාර්තමේන්තු වැය විෂයයෙන් වැටුප් ලබන නිලධාරීන් අනුයුක්තව සිටින දෙපාර්තමේන්තුවේම එක් අංශයක් විසින් නීත්‍යානුකූල නොවන ලෙස වෙනම අයවැය ලේඛනයක්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම හා වියදම් දැරීම සිදු කර තිබුණි. | හේතුව සමෘද්ධි පනතේ 25(3) වගන්තිය ප්‍රකාරව ස්වාධීන සංස්ථාපිත මණ්ඩලයක් වන ප්‍රජාමූල බැංකු පද්ධතිය මෙම අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වීමය.ඒ අනුව එම අංශයේ වියදම් දැරීම වෙනුවෙන් වෙනම වියදම් ඇස්තමේන්තුවක් සකස් කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශයක් ද පිළියෙල කරනු ලබන බව. | නොහැක. බැංකු පද්ධතිය දෙපාර්තමේන්තුව යටතේ පාලනය විය යුතුයි. |
| (උ) | 2023 දෙසැම්බර් 31 දිනට සමෘද්ධිලාභීන්ගේ සහනාධාර මුදලින් අනිවාර්ය ඉතුරුම් ලෙස රඳවාගත් රු.43,472,014,278 ක මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ආයෝජන පොළිය රු.2,819,900,095 ක් වේ. බැංකු මූල්‍ය අංශය විසින් 2023 වර්ෂය තුලදී සියයට 11 සිට සියයට 26 දක්වා පොලි අනුපාත යටතේ මෙම මුදල් ආයෝජන කර ඇතත් බැංකු වෙත ලබා දි ඇත්තේ සියයට 5 ක් වැනි අඩු පොලි අනුපාතයකි. මින් සමෘද්ධිලාභීන් වෙත ගෙවිය යුතු පොලිය කළමනාකරණ තීරණ ප්‍රකාරව සියයට 4 කි. අනිවාර්ය ඉතිරිකිරිම් මුදල් සෘජුවම බැංකුව වෙත ප්‍රේෂණය නොකර බැංකු මූල්‍ය අංශය තුළ රඳවාගෙන ආයෝජනය කිරිම තුළින් ප්‍රජාමූල බැංකුව විසින්ම ආයෝජනය කර පොලී ආදායම උපයා ගැනීම අහිමිවීම හා එම මුදල් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු වෙනුවෙන් යෙදවීමට නොහැකිවීමේ අවාසි සහගත තත්වයක් ද උදා වී තිබුණි. | 2022 ආයෝජන ලෙජරය අනුව හදුනානොගත් අනිවාර්ය ඉතුරුම් ශේෂය පොලී ආදායම් ඉපයීම සඳහා ආයෝජනය කර ඇති බව හා අනිවාර්ය ඉතුරුම් මුදල් වලින් මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 23.477 ක ක් ලබාගෙන ඇති අතර එම මුදල් සඳහා ආයොජන පොලී ආදායම් අහිමි වී ඇති අතර එම මුදල් සත්‍ය වශයෙන්ම ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට බැරවී ඇති අතර එබැවින් සියළුම ප්‍රතිලාභීන් අතර ඉපයූ ආදායමෙන් පොලී ගෙවීමේදී ලද පොලියට වඩා ගෙවූ පොලීය වැඩිවී ඇත. එමෙන්ම අඩු පොලී අනුපාතයක් ප්‍රතිලාභීන්ට ගෙවීමටද මෙම හේතුව බලපා ඇති බව. | අනිවාර්ය ඉතුරුම් මුදල් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු වෙනුවෙන් ඵලදායි ලෙස යෙදවීමට කටයුතු කළ යුතුයි. |

**(ii) බැංකු මූල්‍ය අංශය සතු අරමුදල් වලින් සේවකයින් සඳහා ණය ලබාදීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රජාමූල බැංකු, දිස්ත්‍රික් කාර්යාල හා බැංකු මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට පටහැනිව සේවක පරිභෝගික ණය, සේවක නිවාස ණය, විශේෂ සේවක ණය හා විශේෂ ආපදා ආදි වශයෙන් සේවක ණය යෝජනා ක්‍රම මගින් ණය ලබා දී 2023 දෙසැම්බර් 31 දිනට රු බිලියන 14.2 ක මුදලක් (පිටහිටි ශේෂය) අයවීමට තිබුණි. මෙම සේවක ණය වලින් රු මිලියන 290. 6 ක මුදලක් ගෙවීම් පැහැරහැරීම් හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු නොකර බොල්ණය ලෙස වෙන් කිරීම් කර තිබුණි. | අංශය තුළ ඇති විවිධ අරමුදල් මේ සඳහා යොදාගෙන ඇත සමෘද්ධි බැංකු හා බැංකු සමිති වලින් ලබාදෙන ණය වර්ග ඒ ඒ බැංකු හා බැංකු සමිති අරමුදල් වලින් ලබාදීමට කරයි. එමෙන්ම මෙම ණය ලබාදීම පිණිස බැංකු හා බැංකු සමිති කළමණාකරන මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති බව. | රජයේ නිළධාරීන් සඳහා අරමුදල් භාවිතා කර ආයතන සංග්‍රහයට හා පවත්නා නීති රීතිවලට පරිබාහිරව සේවක ණය ලබාදිය නොහැකි බැවින් දැනට අය නොවන ශේෂ සඳහා රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර අතර ණය අනුමත කළ නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ මුදල් අංශය යටතේ පවතින සේවක ණය චක්‍රීය අරමුදලේ 2023 ජූනි 30 දිනට අයවිය යුතු ණය ශේෂ රු.30,449,227 ක් වන අතර 2020 වර්ෂයේ සිට මෙම චක්‍රීය ණය යෝජනා ක්‍රමය අත්හිටුවා තිබුණි. සේවකයින්ගෙන් රැස්කර ගන්නා මුදලින් රු. මිලියන 186 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. සමෘද්ධි අධිකාරිය පැවති කාලයේ සිය පැවත එන මෙම අරමුදලේ 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශ සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සේවක ණය චක්‍රීය අරමුදලෙහි ගිණුම් මේවනවිට සකස් කරමින් පවතින අතර එම කාර්ය කඩිනමින් අවසන් කර විගණනයට ඉදරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන සකස් කොට විගණනයට ඉදිරිපත් කල යුතුයි. |

**(iii) නිරවුල් නොකළ ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා අරමුදල් ගිණුම් වලින් 2020 වර්ෂයේදී ජීවන තත්ත්වය යථා පරිදි පවත්වාගෙන යාමේ අරමුණින් අඩු ආදායම් ලාභී පවුල් වෙත රු. 5,000 ක දීමනාවක් ලබාදීම සඳහා බැංකු පද්ධතිය තුලින් රු. මිලියන 32,418 ක මුදලක් ලබාගෙන 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 03 කට වැඩි කාලයක් ගත් වී තිබූ නමුත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේ බැංකු අංශයේ අරමුදල් ප්‍රතිපූරණයට 1501 (4) වැය විෂය යටතේ ලබාදී ඇති රු.බිලියන 36 ක ප්‍රතිපාදනයෙන් 2024 වර්ෂය තුළ මෙම මුදල ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කරන බව. | බැංකු පද්ධතියෙන් ලබාගත් මුදල් බැංකු වෙත නැවත ගෙවීමට කටයුතු කල යුතුයි. |

(iv) බැංකු පද්ධතිය තුල සිදු වූ මූල්‍ය වංචා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු පද්ධතිය තුල සිදු වූ මූල්‍ය වංචා සම්බන්ධයෙන් විමර්ශන කටයුතු විනය පරීක්ෂණ කටයුතු සඳහා වාර්ෂිකව මුදල් වියදම් කිරීම දෙපාර්තමේන්තුවෙන් වැය විෂයන්ගෙන් 2023 වර්ෂයට අදාලව විමර්ශන කටයුතු සඳහා හා ගමන් වියදම් සඳහා රු. 4,733,099 ක මුදලක් හා වෙනත් වියදම් වැය විෂයෙන් රු. 1,980,421 ක මුදලක් ගෙවා තිබුණි. නමුත් මෙම වංචා කරන ලද මුදල් ආපසු බැංකු පද්ධතියට බැරකර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ වංචා හා වැරදි 209 කින් රු. 35,715,777 ක මුදලක් බැංකු පද්ධතියට අයකිරීම් ලෙස ලබාගෙන තිබුණි. බැංකු පද්ධතිය පරිපාලනය මෙහෙයවීම මූල්‍ය කටයුතු ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් මඟින් | බැංකු කළමනාකරණ මණ්ඩලයට මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව. | බැංකු පද්ධතිය සඳහා දරනු ලබන වියදම් බැංකු වලින් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කල යුතුයි. |

පාලනය වන බැවින් නිලධාරින් වෙත ගෙවනු ලබන උක්ත දීමනා බැංකු අරමුදල් වලින් නොදරා දෙපාර්තමේන්තු වැය විෂයන්ගෙන් ගෙවා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 ඔක්තෝබර් 23 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2023/02 හි 5 ඡේදයෙහි (iii) කරුණ පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා නිසි ඇස්තමේන්තුවකින් තොරව නිකුත් කිරිම හේතුවෙන් අවස්ථා 16 කදී ලබා දී තිබූ මුදල රු. 770,630 ක් වූ අතර අත්තිකාරම් මුදල් වලින් රු. 517,319 ක් ආපසු පියවා නොතිබුණි. | වැඩසටහන් සැලසුම් කිරීමේදී සහ ඒවාට ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී අත්‍යවශ්‍ය කාර්යයන් විධිමත් පරිදි හඳුනා ගෙන නිවැරදි සහ යථාරූපී ඇස්තමේන්තු පිළියෙල කිරීමටත් ඒ අනුව මූල්‍ය කටයුතු සිදු කිරීමටත් නිලධාරීන් දැනුවත් කර අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කිරීමට කටයුතු කරන බව. | අවශ්‍යතාවය පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිදහස් කල යුතු අතරම ආපසු පියවීම චක්‍රලේඛය ප්‍රකාරව සිදු කළ යුතුයි. |

**2.2 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොදු තැන්පත් ගිණුම් කාල විශ්ලේෂණ වාර්තා අනුව 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල නිරවුල් නොකොට ඉදිරියට ගෙන එමින් පැවති තැන්පතු අවුරුදු 2 ට වැඩි නිරවුල් නොකළ ශේෂය රු. 2,378, 777,131 කි. ඉන් අවුරුදු 2-5 අතර ශේෂය රු. 3,079,925 ක් ද අවුරුදු 5 ට වැඩි ශේෂය රු. 2,375,697,206 ක් ද විය. | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි අධිකාරියෙන් ලබාගත් ණය මුදලෙහි තවදුරටත් පියවිය යුතු රු.බිලියන 2.3 ක ශේෂය පියවීම සඳහා මුදල් ලබාගැනීමට කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඇති බව හා අදාල අනුමැතීන් ලද පසු භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රතිපාදන සලසා ගෙන මෙම බැදීම නිරවුල් කිරීමට කටයුතු කරන බව. | රු. බිලියන 2.3 ක මුදල දෙපාර්තමේන්තුව යටතේ පවතින බැංකු මූල්‍ය අංශයට ගෙවිය යුතු බැවින් හා එම අංශය සතු කිසිදු අරමුදලක් නීත්‍යානුකූල නොවන බැවින් දෙපාර්තමේන්තුව හා බැංකු මූල්‍ය අංශය අතර ගිණුම් සටහන් මඟින් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු ගණකාධිකාරිවරයාගේ අධීක්ෂණය නොමැතිව බැංකු මුලාය අංශය යටතේ ජංගම ගිණුම් 11 ක් හා මහා සංගමය නමින් ජංගම ගිණුම් 2 ක් හා ඉතිරි කිරිමේ ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ගිණුම් වල 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු මිලියන 42 කි. මුදල් රෙගුලාසි 381 ප්‍රකාරව මෙම කිසිදු ජංගම ගිණුමක් සම්බන්ධයෙන් භාණ්ඩාගර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර සමෘද්ධි අධිකාරිය පැවැති කාලය තුල මෙම ජංගම ගිණුම් බැංකු අංශය මගින් විවිධ වැඩසටහන් සඳහා පවත්වාගෙන ගොස් ඇති අතර ඒ අනුව මෙම බැංකු ගිණුම් විවෘත කර ඇත. දෙපාර්තමේන්තු බවට පත් වන අවස්ථාවේ දිවිනැගුම පනතේ අංක 45 වගන්තිය අනුව පැවති ආකාරයෙන් මෙම ගිණුම් පවත්වාගෙන යනු ලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට ක්‍රියා කළ යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ආහාර සුරක්ෂිතාව ඉහත නැංවිම සහ වසවිසෙන් තොර දේශිය ආහාර නිෂ්පාදනයේ නියැලෙන සුළු පරිමාණ ව්‍යවසායකයින් මෙන්ම අනෙකුත් විවිධ නිෂ්පාදනයන් කරන සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ නිෂ්පාදන අලෙවි කිරිමට ස්ථිරසාර වෙළඳපලක් නිර්මාණය කර දීම හා ඒ තුළින් අපේක්ෂිත ආදායම වර්ධනය හා ජීවන තත්ත්වය ඉහල නංවාලීම අරමුණු කොටගෙන දිවයින පුරා සුවබොජුන්හල් 31 ක් ආරම්භ කිරීම සඳහා රු.171,370,352 ක් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය | අක්මීමන හා හබරාදූව යන බොජුන් හල් දෙකෙහි ඉතිරි අත්‍යවශ්‍ය ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් එහි අලෙවි කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇති අතර අක්මීමන සමෘද්ධි සුව බොජුන් හලෙහි ඉතිරි ඉදිකිරීම් සඳහා විමධ්‍යගත අරමුදලෙන් රු. මිලියන 2.335 ක මුදලක් ලැබී ඇති අතර මේ වන විට ඉදිකිරීම් කටයුතු සඳහා වන ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කරමින් සිටින බව. | අලෙවි සැල් වල ඉදිකිරීම් නිම කොට අඩු ආදායම්ලාභීන්ට ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | දක්වා වැය කර තිබුණි. මේ අතරින් 2021 වර්ෂයේදී රු.8,969,457 ක් වැය කොට ඉදිකරන ලද අක්මීමන හා හබරාදූව සුවබොජුන්හල් දෙකක ව්‍යාපාර කටයුතු 2023 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කර නොතිබුණි. | | |
| (ආ) | කුරුවිට කාහේන්ගම සමෘද්ධි වෙළඳ මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා රු 3,930,000 ක් වැය කර තිබුණි. කඩකාමර ඉදිකිරීම් තවදුරටත් සංවර්ධනය කලහැකි වන පරිදි ස්ලැබ් එකක් යොදා පහත මහලේ කාමර 9 ක් සකස් කර තිබුණ අතර නිම කර නොමැති කාමර 2 පුද්ගලයින් දෙදෙනෙකුට ලබාදී තිබුණි. මෙම කඩකාමර අවිධිමත් ආකාරයට ඉදිකිරීම හේතුවෙන් කඩහිමියන්ට අපද්‍රව්‍ය බැහැර කිරීම, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිවීම, වැනි ගැටළු වලට මුහුණපෑමට සිදු වී තිබුණි. | කඩ කාමර 2 ක් ව්‍යවසායකයින්ට ඔවුන්ගේ කැමැත්ත මත ලබා දීමට කටයුතු කළ අතර, ඉදිරියේදී ප්‍රතිපාදන ලැබුණු පසු පවතින අඩු පාඩු සකස්කර ලබාදෙන බවත් කුරුවිට ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව. | කඩකාමර විධිමත් ලෙස අඩු ආදායම්ලාභීන්ට ලබාදීමට කටයුතු කල යුතු අතර පවතින ගැටළු නිරාකරණය කොට උපරිම ලෙස මධ්‍යස්ථානය භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | පුත්තලම- කරුවලගස්වැව සුව බොජුන් හල සඳහා රු. 1,065,600 ක් 2018 වර්ෂයේදී වැය කර ඉදිකර තිබූ අතර පුද්ගලයින් 5 දෙනෙකු විසින් වෙළඳ කටයුතු කරගෙන ගියද වර්තමානය වන විට මධ්‍යස්ථානය ජල විදුලි සබඳතා බිඳ වැටී වල් බිහිවී තිබුණි. | සමෘද්ධි ප්‍රතිලාභීන් 05 දෙනෙකු සම්බන්ධ කරගෙන මෙම බොජුන්හලේ අලෙවි කටයුතු 2020.02.07 දින ආරම්භ කරන ලද නමුත් කොරෝනා වසංගතය හේතුවෙන් මෙම බොජුන් හල වසා දමා ඇත. කරුවලගස්වැව ප්‍රාදේශීය සංවිධානය විසින් සතිපොලක් මෑතක් වනතුරු පැවැත්වූ අතර, නිසි අනුමැතියකින් පසුව ප්‍රාදේශීය සංවිධානය සතු අරමුදල් මගින් මෙම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර නව ව්‍යාපෘති ආරම්භ කිරීමට හැකි බව කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව. | ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රාදේශීය ලේකම් හරහා සිදුකරවා ගැනීමට ක්‍රියාකර ඵලදායි ලෙස මධ්‍යස්ථානය භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටි මානවේරිය දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථානය රු. 12,193,773 ක් වියදම් කර ඉදිකර තිබුණු අතර 2019 ජූනි 10 දින ආරම්භ කර තිබුණි. 2019 සිට වරින් වර ව්‍යවසායකයන් 15 කට ආසන්න ප්‍රමාණයක් වෙළඳ කටයුතු සිදුකල ද වර්තමානය වන විට දෙදෙනෙකු පමණක් අලෙවි කටයුතු වල නිරත වී තිබුණි. 2019 වර්ෂයේ ආරම්භයේ සිට කිසිදු කුලී මුදලක් ඔවුන්ගෙන් අයකරගෙන නොතිබුණි. මෙම මධ්‍යස්ථානය වගුරුබිමක් ගොඩ කර ඉදිකිරිම නිසා බැමි පුපුරා ගොස් තිබුණු අතර ගිලා බැසීමට ලක්ව තිබුණු බව 2024 ජනවාරි 12 සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරික්ෂණය විය. මෙම මධ්‍යස්ථානය සඳහා ආරම්භයේ සිටම ජල පහසුකම් ද ලබාදී නොතිබුණි. | මානවේරිය දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථානයේ ඉදිකිරිම් සම්බන්ධයෙන් තිබෙන ගැටළුව සඳහා අදාල පිළිතුරු ලබාදෙන ලෙස දිස්ත්‍රික් ඉංජිනේරු වෙත දන්වා ඇති බව පුත්තලම දිස්ත්‍රික් අලෙවි විෂය භාර කළමනාකරු විසින් දුරකතනයෙන් දන්වන ලද බව. | දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් මෙම ඉදිකිරීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර අලෙවි මධ්‍යස්ථානය ඵලදායි ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මාතලේ දිස්ත්‍රික්කය තුළ 2021 වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11 ක් ජීවනෝපාය විශේෂ ව්‍යාපෘති සඳහා රු. 3,708,710 ක් වැයකර තිබුණි. මේ සමඟ සිදුකල භෞතික පරික්ෂාවේදී රු. 2,094,825 ක් ලබාදුන් උපකරණ නිෂ්කාර්යව පැවතුණ අතර රු. 275,662 ක උපකරණ කැඩී තිබුණි. රු. 184,350 ක උපකරණ විකුණා හා උකස් කර තිබූ අතර රු. 134,273 ක උපකරණ විගණන අවස්ථාවල භෞතිකව නිරීක්ෂණය නොවීය. | පිළිතුරු ලබාදී නොමැත. | ව්‍යාපෘති සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදු කර ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

**3.2** **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට 2023 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව දෙපාර්තමේන්තු විමර්ශන අංශයට මූල්‍ය වටිනාකම රු. 234,961,395 ක් වූ මූල්‍ය වංචා 165 ක් වාර්තා වී තිබුණ අතර ඉන් තවදුරටත් රු. 218,482,947 ක් වූ මූල්‍ය වංචා 98 ක විනය කටයුතු සිදුකරමින් පවතින අතර 2014 ජනවාරි 03 දින සිට 2018 අගෝස්තු 31 දක්වා බැංකු හා බැංකු සමිතිවල සිදු වූ මූල්‍ය අක්‍රමිකතා වලින් රු. 263,817,207 ක අක්‍රමිකතා 15 ක කටයුතු අවසන් කර නොතිබුණි. නිලධාරින් විසින් දිගින් දිගටම මෙසේ මූල්‍ය වංචා සිදු කිරීමට බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු සකස් කිරීම හා විනය නියෝගය තුළින් දඬුවම් ලිහිල් වීමද වංචා වැඩිවීමට හේතුවී තිබුණි. | මූල්‍ය වංචාවන් නිරන්තරයෙන් සිදු කිරීම සම්බන්ධයෙන් සමෘද්ධි බැංකු පද්ධතිය තුළ පවතින අඩුපාඩු සකස් කර ගැනිම සඳහා ක්ෂුද්‍රමූල්‍ය අධ්‍යක්ෂ දැනුවත් කර ඇති අතර, විනය නියෝග තුළින් දැඩි දඬුවම් ලබා දීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය වංචා සිදුනොවන ලෙස බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු සකස් කල යුතු අතර විනය නියෝග දැඩි කිරීමට හා සිදුකර ඇති වංචා සම්බන්ධව කටයුතු කඩිනම් කළ යුතුයි. |
| (ආ) | ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 ඡේදයට අදාලව 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රේල්ඛ 30/2019 තුළින් මූලික විමර්ශනය මාස 2 ක් ඇතුළත අවසන් කළ යුතු වුවද වංචා, දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධතාවයෙන් මූලික විමර්ශන සිදුකර විනය නියෝග ලබාදීම ප්‍රමාදවීම් වසර 2 සිට වසර 10 දක්වා කාල පරාසයක පැවතුණි. | විමර්ශනවල ස්වභාවය අනුව නියමිත කාලය තුළ අවසන් කිරීමට නොහැකි වේ. එසේ වුවත්, ඒ සඳහා වැයවන කාලය අවම කර ගැනිමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරින් දැනුවත් කර ඇති බව. | විමර්ශන සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2013 අංක 1 දරන දිවිනැගුම ආඥාපනතේ 36 වගන්තිය යටතේ දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, ත්‍යාග පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් ත්‍යාග වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකර ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම සංවර්ධන අරමුදලට බැරකල යුතු වුවත් අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි. දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවීමට භාණ්ඩාගාරයේ විරෝධතාවයක් නොමැති බව 2021 මැයි 03 දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව සමෘද්ධි අරමුදල පිහිටුවීමට අවස්ථා නවයක දී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලුම් කර ඇතත් මෙතෙක් එම අනුමැතීන් ලැබී නොමැති බැවින් පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදල පිහිටුවීමට හැකියාව ලැබී නැති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදල පිහිටුවීමට කටයුතු කල යුතුයි. |
| (ඈ) | සමෘද්ධි ප්‍රජා මූල බැංකු ගණුදෙණු කාර්යක්ෂමව කිරීම සඳහා Soft Watch හා SLTS වශයෙන් මෘදුකාංග දෙකක් හඳුන්වා දී තිබුණි. soft watch මෘදුකාංගය බැංකු 326 ක්, බැංකු සමිති 104 ක් සඳහා ලබාදී තිබූ අතර SLTS මෘදුකාංගය බැංකු 756 ක් හා බැංකු සමිති 229 ක් සඳහා ලබාදී තිබුණි. පද්ධතිය නියමිත පරිදි අදාළ කාර්යයන් ඉටුකර ගැනීමට ක්‍රියාත්මක නොවීම හා පරිගණක පද්ධතිය විටෙන් විට බිඳ වැටීම, බැංකුවේ සජීවී දත්තවලට ඇතුල් වීමේ හැකියාව මෘදුකාංග ආයතනයට තිබීම හේතුවෙන් දත්ත වෙනස්කල අවස්ථා පැවතීම නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ප්‍රජාමූල බැංකු පරිගණක පද්ධතිය කාර්යක්ෂමව කිරීම සඳහා 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ නමුත් එහි සඳහන් දෝෂ 6 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කර නොතිබුණි. | අන්තර්ජාල සබඳතා බිඳ වැටීම හේතුවෙන් අඛණ්ඩව බැංකුවේ කටයුතු පවත්වාගෙන යෑම සඳහා Backup අන්තර්ජාල පහසුකමක් ලබා ගන්නා ලෙස උපදෙස් ලබාදී ඇති අතර,අවශ්‍ය ධාරිතාවයට Server පහසුකම් ලබා දීම තුළින් පද්ධතියන්ගේ මන්දගාමී බව තුරන් කර ඇති බව , පරිගණක පද්ධති සඳහා සේවා සපයනු ලබන ආයතන දෙකෙහි සිටින නිලධාරීන් කිහිප දෙනෙකුට පමණක් පද්ධතියේ දත්ත වලට පිවිසීමට හැකියාව ඇති බව හා බැංකු වල මැනුවල් ක්‍රියාවේදී ඇති වී ඇති දෝෂ නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව. | පද්ධතිය කාර්යක්ෂමව පවත්වා ගැනීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය තුළින් ණය වර්ග 34 ක් යටතේ ප්‍රතිලාභීන් 12,309,875 ක් සඳහා ණය ලබා දීම සිදුකර තිබුණ අතර 2023 වර්ෂය තුළ ප්‍රතිලාභීන් 350,604 කට ණය ලබාදී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට පිටහිටි ණය ශේෂය රු. බිලියන 73.8 කි. 2023 දෙසැම්බර් 31 දිනට පිටහිටි ණය ශේෂයෙන් සියයට 8 ක් බොල්ණය ලෙස වෙන්කර තිබුණි.එය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 1 කින් වර්ධනය වීමකි. සමස්ථ බැංකු පද්ධතිය සතු මුළු ආයෝජනය රු. බිලියන 242 ක් වුවත් ප්‍රතිලාභීන් සඳහා ලබාදී තිබූ ණය ප්‍රමාණය රු. බිලියන 73.8 ක් වේ. එය සමස්ථ ආයෝජනයෙන් සියයට 30 ක් පමණි. | 2020,2021 හා 2022 යන වර්ෂවල පැවැති කොරෝනා වසංගත තත්වය හා ආර්ථික අවපාතය හේතුවෙන් රටේ පැවැති ව්‍යාපාරික අස්ථාවරත්වය හමුවේ බැංකු පද්ධතියේ ණය ඉල්ලුම සීඝ්‍රයෙන් පහල වැටී ඇති බව හා 2023 වර්ෂයේ සිට බැංකු පද්ධතියේ ණය නිකුත් කිරීම ක්‍රමයෙන් වර්ධනය වීමෙන් 2023 දෙසැම්බර් 31 වන විට පිටහිටි ණය ප්‍රමාණය ඉහල අගයක් ගනු ඇති බවත්, වසංගතය හේතුවෙන් ණය අයවීම අඩුවීම හා සමෘද්ධි බැංකු වල ණය ප්‍රතිශතය වැඩි කර ගැනීම සඳහා ණය වර්ග කීපයක් අළුතින් හඳුන්වා දී ඇති බව. | බැංකු පද්ධතිය සතු මුදල් ආයෝජනය කිරීමට වඩා ප්‍රතිලාභීන්ට ණය ලබාදීම වර්ධනය කිරීමට කටයුතු කලයුතු අතර, ණය අයකර ගැනීම කාර්යක්ෂමව සිදු කල යුතුයි. |
| (ඊ) | රටවිරුවන් සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ණය ආපසු නොගෙවීම නිසා හෝ වෙනත් ක්‍රියාකාරකමක් නිසා සමෘද්ධි අධිකාරියට සිදුවන පාඩුවක් හෝ වියදමක් වෙතොත් එය බෙදී යන ආකාරයෙන් ක්‍රියා කිරීමට එකඟව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2013 වර්ෂයේදී රු. මිලියන 100 ක මුදලක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙත ලබාදී තිබුණි. ඒ අනුව සමෘද්ධි බැංකු විසින් රටවිරුවන් 11,929 ක් සඳහා රු. 3,547,133,064 ක මුදලක් ණය වශයෙන් නිකුත් කර තිබුණි. රට විරුවෝ නිවාස ණය ව්‍යාපෘතිය සඳහා සමෘද්ධි අධිකාරිය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර 2012 මාර්තු 07 දින වසර 5 ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර එය 2018 මාර්තු 06 දිනෙන් අවසන් වී තිබුණි. නව අවබෝධතා ගිවිසුම ඉක්මනින් අත්සන් කර ණය ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී තිබූ නමුත් 2023 ඔක්තෝබර් 30 වන විටත් දෙපාර්ශවය විසින් නව අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි. ඒ අනුව තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු. 193,078,303 ක් වී තිබුණි. | සමෘද්ධි බැංකු මට්ටමින් තොරතුරු ලබාගනිමින් පවතී මසක් ඇතුලත තොරතුරු ලබාගත හැකි අතර අනතුරුව විදේශ සේවා නියුත්ති කාර්යංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට සැලසුම් කර ඇත අතර ඒ සඳහා දිනයක් වෙන් කර ගැනීම පිණිස විදේශ සේවා නියුත්ති කාර්යංශය වෙත දැනුම් දී ඇත. | අයවිය යුතු ණය ශේෂ අයකරගැනීමට කටයුතු කල යුතුයි. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020/13 හා 2020 සැප්තැම්බර් 27 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය මඟින් දෙපාර්මේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින්ම බාහිර විගණකයකු ලෙස කටයුතු කිරිමට අවස්ථාව ලබා දී තිබුණි. ඒ අනුව 2016, 2017, 2018 හා 2019 වර්ෂවලට අදාළව බාහිර විගණනය සිදු කිරිම වෙනුවෙන් දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරින්ට එක් විගණන වාර්තාවක් සඳහා රු. 3,000 ක් බැගින් බැංකු හා බැංකු සමිති 1007 කට අදාළව වාර්තා විගණනය සඳහා රු. 12,885,672 ක් බැංකු මූල්‍ය අංශය විසින් ගෙවා තිබුණි. මේ සඳහා 2020 ඔක්තෝබර් 15 දිනැති අංක 2020/75/05 දරන කළමනාකරණ මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණ ද එය විගණන මූලික මූලධර්ම වලට අනුකූල නොවන බව නිරීක්ෂණය විය. | 2020 මාර්තු 11 දින පැවැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමණාකරන මණ්ඩල තීරණ අංක 2020/60/09 අනුව 2013 සිට 2019 දක්වා මූල්‍ය ප්‍රකාශන විගණනය කර එම වාර්තා අනුමත කිරීමට අභ්‍යන්තර විගණන අංශයට බලය ලබා දී ඇති බව. | දිවිනැගුම පනත ප්‍රකාරව සමෘද්ධි බැංකු හා සමිති දෙපාර්තමේන්තු විගණනයට යටත් කර ඇති බැවින් විගණනය කිරීම වෙනුවෙන් බැංකු හා සමිති වලින් ඒ සඳහා මුදල් අයකල නොහැකි බැවින් මෙම ලබාදුන් මුදල් අදාල නිළධාරීන්ගෙන් ආපසු අයකරගැනීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | දිස්ත්‍රික්ක 12 කට අයත් 2020 හා 2021 වර්ෂවලට අදාලව ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 197 ක මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන මතයක් 2024 මාර්තු 28 දින වන විටත් නිකුත් කිරීම සිදුකර නොතිබුණ අතර 2022 වර්ෂයේ ප්‍රජා මූල බැංකු 1074 කින් 33 ක් හා බැංකුසමිති 331 න් එක් සමිතියක්ද වශයෙන් ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 1455 ක මූල්‍ය ප්‍රකාශන අතරින් විගණනය සිදු කර මත නිකුත් කර තිබුනේ මූල්‍ය ප්‍රකාශන 34 ක පමණි. | මෙම බැංකු/ බැංකු සමිති නිශ්චිතව හඳුනාගෙන අධීක්ෂණ නිලධාරීන් මගින් පරීක්ෂා කර නිරීක්ෂණ නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අතර,එහි ප්‍රගතිය ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව. | පනතින් ලබාදී ඇති බලතල ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නොපමාව විගණනය කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමිතිවල අවසන් ගිණුම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විගණන මත පිළිබඳ ප්‍රගති වාර්තාව අනුව 2015 සිට 2019 දක්වා වසර 5 ක මූල්‍ය ප්‍රකාශන 6710 කින් 2492 ක මතය ව්‍යාචනය කර ඇති අතර සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිඹිබු කර ඇත්තේ මූල්‍ය ප්‍රකාශන 782 ක පමණි. දිස්ත්‍රික්ක 21 කට අදාල බැංකු 297 ක 2019, 2020 හා 2021 යන වර්ෂ තුනටම අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කළ විගණන මතය ව්‍යාචනය කර තිබුණි. ඒ අනුව සමෘද්ධි බැංකු කළමනාකරුවන් විසින් එම බැංකු මනා අධීක්ෂණය කිරීමද, විමර්ශන නිලධාරීන් විසින් නිවැරදිව විමර්ශනය කිරීමද, විගණන නිලධාරින් විසින් සමෘද්ධී බැංකුවල අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හදුනාගෙන ඒවා නිවැරදි කිරීමද, මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියල කිරිමට හා බැංකු පද්ධතියේ කාර්යක්ෂමතාවය, ඵලදායිත්වය ඉහල නැංවීමට උපරිම දායකත්වයක් දක්වා නොතිබුණි. | අදාල වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන විගණනය කර නිරීක්ෂණ වාර්තා නිකුත් කර ඇතත්, එම නිරීක්ෂණ නිවැරදි කිරීම පිළිබඳව අවධානය යොමු නොකොට අදාල වර්ෂයට විගණන මත නිකුත් කර ඇති බව. | අභ්‍යන්තර විගණනය මෙන්ම විමර්ශන අංශයද බැංකු පද්ධතියේ කාර්යක්ෂමතාව වෙනුවෙන් උපරිම දායකත්වය ලබාදිය යුතු අතරම බැංකු හා සමිති විසින් ලබාදෙන නිර්දේශ අනුව ක්‍රියාකල යුතුයි. |
| (ඈ) | 2015 සිට 2019 දක්වා වර්ෂවල ප්‍රජාමූල බැංකු මූල්‍ය ප්‍රකාශන විගණනය කර සත්‍ය හා සාධාරණ මත නිකුත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 782 ක් අතරින් මූල්‍ය ප්‍රකාශන 49 ක බොල්ණය අනුපාත ඉහල යාම හේතුවෙන් ලාභ විසර්ජනය සඳහා අවසර ලබාදී නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත ලැබී තිබුණු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 6710 කින් ලාභ විසර්ජනය සඳහා අවසර ලබා දී තිබුණේ මූල්‍ය ප්‍රකාශන 1735 ක් සඳහා පමණි. මේ හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට කොටස්කරුවන්ට ගෙවිය යුතු රු. 6,344,018,725 ක ලාභාංශ ගෙවීමට නොහැකි වි තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | කොටස්කරුවන්ගේ වාර්ෂික ලාභාංශ නියමිත කාලවකවානු වලදී ලබාගතහැකි වන පරිදි බොල්ණය අනුපාතය අඩුකරගැනීමටත් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමටත් කටයුතු කල යුතුයි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ අනුව 97 වන වගන්තිය ප්‍රකාරව හා 59 වන වගන්තිය අනුව රාජ්‍ය සේවයේ කිසියම් තනතුරකට යම් තැනැත්තෙකු විසින් පත්කිරීම් බලධරයා වෙත සාවද්‍ය තොරතුරු හෝ ව්‍යාජ (කූට) ලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය වූ විටෙක එම පත්වීම් වහාම අවලංගු කර එය ශූන්‍ය හා බලරහිත කර, ඒ වන විටත් වැටුප් හා දීමනා වශයෙන් රජය විසින් ගෙවා ඇති සියළු මුදල් එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකල යුතු නමුත් නිළධාරීන් 363 දෙනෙකු විසින් සිය පත්වීම් ලබා ගැනීමට පෞද්ගලික ලිපිගොනුවට ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන සහතික ව්‍යාජ සහතික බවට සනාථ වී තිබුණි. ඉන් 77 දෙනෙකු සේවයෙන් පහකර තිබුණු අතර 20 දෙනෙකු පනත ප්‍රකාරව වන්දි ලබාගැනීමේ එකඟතාවයෙන් සේවයෙන් ඉවත් වී තිබුණි. නියැදි විගණනයට භාජනය වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සේවය කර විශ්‍රාම වැටුප් රහිතව සේවය අවසන් කර තිබුණු නිලධාරින් හා දැනට සේවයේ යෙදී සිටින නිලධාරින් 30 දෙනෙකු විසින් පත්වීම් දින සිට රු. 195,215,660 ක් ද, මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක නිළධාරීන් 4 දෙනෙකු වෙනුවෙන් 1999 වර්ෂයේ සිට රු. 40,383,176 ක්ද, කොළඹ හා මාතර දිස්ත්‍රික්ක වල නිළධාරින් 17 දෙනෙකු සඳහා 2023 වර්ෂයට අදාලව පමණක් රු. 8,732,204 ක් ද වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණ ද වගකිව යුතු නිලධාරින් විසින් මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ආරම්භයේ දී නිලධාරීන් බඳවා ගැනීම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදුකර ඇති අතර , එසේ බඳවාගැනීමේ දී ඉදිරිපත් කළ අධ්‍යාපන සහතික සනාථ කර ගැනීම ප්‍රමාද කිරීම හේතුවෙන් ව්‍යාජ සහතික හිමි නිලධාරීන් හඳුනාගැනීම ප්‍රමාද වී ඇත. 2022 වර්ෂයේ දී මොවුන් හඳුනාගනු ලැබුවද ඒ වන විට බොහෝ නිලධාරීන් විශ්‍රාම යාමේ වයසට එළඹ තිබීම හා ඔවුන් දීර්ඝ කාලයක් අධිකාරිය හා දෙපාර්තමේන්තුව යටතේ සේවය කර තිබීමත් මත ඔවුන් පිළිබඳ ක්‍රියාත්මක වීමක් සිදු වී නොමැති බව හා<br>ව්‍යාජ සහතික ඉදිරිපත් කළ නිලධාරීන්ගේ එකමුතුවක් මගින්, අමාත්‍යාංශ ලේකම් වෙත කරනු ලැබූ ඉල්ලීමට අනුව ඔවුන් පිළිබඳව සානුකම්පිතව සලකා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දී ඇති අතර, එම උපදෙස් හා නිර්දේශ වැඩිදුර උපදෙස් හා අනුමැතියට අමාත්‍යාංශ ලේකම් වෙත යවා ඇති අතර එම උපදෙස් හා අනුමැතිය මත ඉදිරි කටයුතු කිරීමට නියමිත බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහය අනුව වගකිව යුතු නිලධාරීන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බැංකු කාර්ය මණ්ඩලයේ නිලධාරින් 9894 ක් සඳහා දෙපාර්තමේන්තු වැය විෂයයෙන් වැටුප් ගෙවීම සිදු කරමින් පවතින අතර 2023 වර්ෂය සඳහා ගෙවා තිබූ මුදල රු. මිලියන 853 ක් විය. ප්‍රජාමූල බැංකු හා සමිති විසින් මෙම වැටුප් වියදම සඳහා වාර්ෂිකව ලාභයෙන් වෙන්කිරිමක් කර තිබුණි. ඒ අනුව බැංකු ආරම්භයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු. බිලියන 43.4 ක මුදලක් රජයට ගෙවිය යුතු වැටුප් වශයෙන් වෙන් කිරිම කර ඇතත් මේ දක්වා එම මුදල් ආපසු රජයට ගෙවිම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මීට අමතරව සමෘද්ධි දෙපාර්තමේන්තු සතු ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ස්ථාපනය කිරීම සඳහා යොදවාගෙන තිබුණි. | බැංකු කාර්යමණ්ඩලයට ගෙවන ලද රු.බි.43.4 ක වැටුප් සම්බන්ධයෙන් බැංකු කළමනාකරණ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | දෙපාර්තමේන්තු වැය විෂයෙන් බැංකු කාර්ය මණ්ඩලයට ගෙවන ලද වැටුප් ආපසු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල යුතු අතර දෙපාර්තමේන්තුව සතු ඉඩම්/ගොඩනැගිලි අදාළ නීති රීති ප්‍රකාරව බදු දීම් හෝ පැවරීම් කළ යුතුය. |